# ජාතික විශ්‍රාමික දිනය අද

**ජාතික විශ්‍රාමික දිනය අදට (8) යෙදේ. මේ ලිපිය ඒ නිමිත්තෙනි.**

**2008 වර්ෂයේ ඔක්තෝබර් 9 වැනිදා අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක් මත ඔක්තෝබර් 8 වැනිදා ජාතික විශ්‍රාමික දිනය ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. ඒ අනුව 2009 වර්ෂයේ සිට රාජ්‍ය මට්ටමින් සහ විශ්‍රාමික සංගම් මට්ටමින් ඒ දිනය උත්කර්ෂවත් ලෙස සැමරීම ආරම්භ විය.**

රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල ස්ථාපනය කරමින් පනවන ලද 1999 අංක 40 දරන පාර්ලිමේන්තු පනතේ එහි පරමාර්ථය ලෙස දක්වා ඇත්තේ 'විශ්‍රාමිකයන්ට තමන්ගේ තත්ත්වය සහ ගරුත්වය පවත්වාගෙන යාමට ආධාර කිරීමෙන් ඔවුන්ගේ සාමාන්‍ය ශුභ සිද්ධිය ප්‍රවර්ධනය කිරීම අරමුදලේ පරමාර්ථය වන්නේය' යනුවෙනි. අද විශ්‍රාම සුවයෙන් පසුවන වැඩිදෙනා මෙයට දශක හතරකට පහකට පමණ පෙර තම රාජකාරිය 'දේව කාරියක්' ලෙස සලකමින්, ප්‍රවාහන, නවාතැන්, විදුලිය, ජලය, ආහාරපාන, තාක්ෂණික උපකරණ ආදී පහසුකම්වලින් තොරව අඩු තරමින් කාර්යාලයේ හෝ පාසලේ අවම පහසුකම්වත් නොමැතිව අසීමිත දුක් කන්දරාවක් විඳිමින්, එහෙත් උපරිම කැපවීමකින් ඉටු කළ අනුපමේය සේවාව ඇගයීම් වශයෙන් ජාතික විශ්‍රාමික දිනයක් ප්‍රකාශයට පත් කිරීම ඉතා සාධාරණ ය.

විශ්‍රාම වැටුප් ක්‍රමය ආරම්භයේ පටන් දිගටම පැවති නීතිය අනුව 'විශ්‍රාම යන අවස්ථාවේ නිලධාරියා ලැබූ වැටුප



පාදක කරගෙන විශ්‍රාම වැටුප ගණනය කරනු ලැබේ' යැයි පිළිගෙන තිබුණත් ජීවන වියදමේ ශීඝ්‍ර ඉහළ යාමත් සමඟ ඉහත සඳහන් නියමය අනුව ගෙවන ලද විශ්‍රාම වැටුපින් එදිනෙදා වියපැහැදම් දැරීම බරපතළ ගැටලුවක් විය. මේ තත්ත්වය සැලකිල්ලට ගෙන විශ්‍රාමිකයන් සංවිධානගත වෙමින් කරන ලද බලපෑම නිසා ඔවුන්ගේ ගැටළුව නිරාකරණය කිරීමට කොමිෂන් සභා කිහිපයක්ම පත් කර ඇත.

'විශ්‍රාමිකයාට ලැබෙන එකම ආදායම විශ්‍රාම වැටුප පමණි' යනුවෙන් බී.සී. පෙරේරා කොමිසම සඳහන් කර තිබුණි. රාජ්‍ය සේවකයාට ලබාදෙන වැටුපෙන් 70% ක ප්‍රතිශතයක් විශ්‍රාමිකයාට ගෙවිය යුතු බව සේනාරත්න කමිටුවේ නිර්දේශය විය. විශ්‍රාමිකයා කවදා විශ්‍රාම ගොස් සිටියත් විශ්‍රාම වැටුප් සංශෝධනය බලගැන්වෙන දිනයේ විශ්‍රාම ගියා සේ සැලකීම පොදු නිර්දේශයක් විය.

2005 වර්ෂයේ අයවැය යෝජනා මඟින් විශ්‍රාමිකයාට ලබාදීමට පොරොන්දු වූ අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ මේ දක්වා ලැබී නැත. 2015 දී රජයේ සේවකයන්ට ලබාදුන් 10,000 ට අදාළව විශ්‍රාමිකයාට ද ලබාදීමට පොරොන්දු වූ මුදලින් 2/5 ක් මේ දක්වා ලැබී නැත. 2016 වසරේ සිට 2020 දක්වා කාලය තුළ විශ්‍රාම ගිය අයට ගෙවිය යුතු විශ්‍රාම වැටුප ලබාදීමට පියවර ගෙන නැත. දිනෙන් දින ජීවන වියදම ඉසිලිය නොහැකි අයුරින් ශීඝ්‍රයෙන් ඉහළ යතත් එයට සරිලන ජීවන වියදම් දීමනාවක් ලැබෙන්නේ නැත. කෙනෙකු විශ්‍රාම ගොස් මාස කිහිපයක් ගෙවී යන තුරුම විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රමාදවෙමින් පවතී. විශ්‍රාම පාරිතෝෂිකය ලබාගැනීමට අවුරුදු ගණනක් බලා සිටීමට සිදුව ඇත. ඇතැම් විට, තමන්ගේ දුක් ගැනවිල්ලක් අදළ බලධාරීන්ට යොමු කළ විට එයට විසඳුමක් තබා ලිපිය ලැබුණු බවත් දැන්වීමක් නැත. ලෙඩකට බෙහෙත් නැත, ඖෂධ හිඟය බරපතළය, තිබෙන ඖෂධ ගිනි ගණන් ය.

කිසියම් පුද්ගල කණ්ඩායමක් හෝ යම් සිද්ධියක් හෝ වෙනත් භෞතික සම්පතක් වෙනුවෙන් ජාතික දිනයක් නම නියම කරන්නේ අදළ කරුණ පිළිබඳව සියලු දෙනාගේ අවධානය, සැලකිල්ල, ගෞරවය ජනිත කර, වැඩි යහපතක් උදකිරීම සඳහා ය. ඒ අනුව ජාතික විශ්‍රාම දිනය, පාර්ලිමේන්තු පනතක පවා සඳහන්කර ඇති පරිදි විශ්‍රාමිකයාගේ 'තත්ත්වය හා ගරුත්වය' පවත්වාගෙන යාමට ඉවහල් වන දිනයක් වන්නේ නම් කොතරම් අගනේ ද? අද දිනයේ අදිටන් කළ යුත්තේ එය නොවේද?

**එච්.එම්.එම්. බණ්ඩාර**
**කුරුණෑගල දිස්ත්‍රික් රාජ්‍ය හා පළාත් පාලන විශ්‍රාමික සංගමයේ සභාපති.**